# විදේශගත ශ්‍රී ලාංකීය සේවා නියුක්තික ඔබ සැමට කෙරෙන ආයාචනයයි

ශ්‍රී ලංකා ආර්ථිකයට මේ දක්වා ඔබ ලබා දුන් අපරිමිත දායකත්වය වෙනුවෙන් ඔබ සැමට ස්තූති වන්ත වන අතරම, ඔබ උපයන විදේශ මුදල් විධිමත් මාර්ග ඔස්සේ මව් රටට එවීමෙන් තව දුරටත් එම සහයෝගය ලබාදෙන ලෙසට අපි ඔබ සැමගෙන් ඉල්ලා සිටිමු.

## ශ්‍රී ලංකාවට ඔබ එවන විදේශ මුදල් වැදගත්වන්නේ ඇයි?

ඔබ වැනි විදේශගත ශ්‍රී ලාංකිකයින් විසින් එවනු ලබන විදේශ මුදල් මගින් ආර්ථිකයට සැලකිය යුතු විදේශ විනිමය ගලා ඒමක් සිදුවන අතර, එය ලෝකයේ සෙසු රටවල් සමඟ අපගේ විදේශීය ගනුදෙනු සිදු කිරීමේදී භාවිතා කළ හැකිය. අප රට තුළ පවතින අත්‍යාවශ්‍ය භාණ්ඩ හා ඖෂධ හිඟය සඳහා හේතු වී ඇති විදේශ විනිමය හිඟය මඟහරවා ගැනීම සඳහා විශේෂයෙන්ම ඔබ විසින් එවනු ලබන විදේශ මුදල් මේ මොහොතේ අපගේ රටට ඉතා වැදගත් වේ. ඔබ විසින් විධිමත් මාර්ග ඔස්සේ **ඕනෑම කටයුත්තක් වෙනුවෙන් එවන විදේශ මුදල්** ශ්‍රී ලංකාව තුළ ඉන්ධන, ගෑස්, ඖෂධ සහ ආහාර වැනි දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍ය විදේශ විනිමය ගනුදෙනු අඛණ්ඩව කරගෙන යාමට ඉමහත් සේ උපකාරී වේ.




## අපගේ ශ්‍රී ලාංකික ආර්ථිකයට ප්‍රයෝජනවත් වන ආකාරයෙන් ඔබගේ වටිනා මුදල් එවන්නේ කෙසේද?

අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ ඖෂධ සඳහා විදේශ විනිමය ගෙවීම් සිදුකිරීමට බැංකුවලට සහ මහ බැංකුවට පහසුකම් සැලසෙන පරිදි ඔබගේ විදේශ මුදල් ඉපැයීම් රට තුළට ලැබීම සහතික කිරීම පිණිස, ඔබ විසින් මුදල් එවීමේදී විධිමත් ක්‍රමවේදයන් පමණක් භාවිතා කරන්න.

## ඔබගේ විදේශ විනිමය ඉපැයීම් ශ්‍රී ලංකාවට එවීමේදී ඔබට පහත සඳහන් විධිමත් ක්‍රමවේදයන් භාවිතා කළ හැකිය.

- ඔබ ගනුදෙනු කරන විදේශීය බැංකුව මඟින් සෘජුවම ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල ඇති ගිණුමකට මුදල් එවීම
- විධිමත් මුදල් හුවමාරු කරන්නන් / විනිමය හුවමාරු ආයතන මගින් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක ඇති ගිණුමකට හෝ ඔබගේ ප්‍රතිලාභියෙකුට මුදල් එවීම
- ශ්‍රී ලංකාවේ මූල්‍ය ආයතන හා සම්බන්ධ මංගත ක්‍රම (Online Platforms)/ යෙදුම් (Apps) භාවිතයෙන් මුදල් එවීම

## ඔබගේ විදේශ විනිමය ඉපැයීම් ප්‍රේෂණය කිරීමට මෙන්ම පහත සඳහන් මූල්‍ය උපකරණවල ආයෝජනය කිරීමට ද හැකිය.

- ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර
- ශ්‍රී ලංකාවේ රජයේ සුරැකුම්පත්
- ශ්‍රී ලංකාවේ කොටස් වෙළෙඳපොළ (සමාගම් කොටස් වල ආයෝජනය)
- ශ්‍රී ලංකාවේ විධිමත් මූල්‍ය ආයතනවල තැන්පතු ගිණුම්

හවාලා (Hawala) සහ උන්ඩියල් (Undiyal) වැනි අවිධිමත් ක්‍රම බැංකු ජාලයට පරිබාහිරව ක්‍රියාත්මක වන බැවින් එම ක්‍රම ඔස්සේ එවනු ලබන විදේශීය මුදල් අත්‍යාවශ්‍ය භාණ්ඩ ආනයනය සඳහා යොදා ගත නොහැක. මෙම අවිධිමත් මුදල් හුවමාරු ක්‍රම භෞතිකමය වශයෙන් පමණක් නොව මාර්ගගත ගෙවීම් (Online payment platform) ආකාරයෙන් ද සිදු වේ. එබැවින්, ඔබගේ විදේශ මුදල් ඉපැයීම් විධිමත් මාර්ග ඔස්සේ රටට එවීම මේ මොහොතේ මව්බිමට ලබාදෙන ඉමහත් සේවයකි.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ පණිවිඩයකි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA


විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව, අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01.
☎ 0112477426 🖷 0112477710 @ frfd@cbsl.lk